# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සැම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 38.පොදු බස් රථ භාවිතය

කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් වර්තමාන තත්ත්වය යටතේ, පොදු බස්රථවල ගමන් කරන මගීන් සංඛ්‍යාව, දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි සීමාවන්ට යටත් වන අතර වෙනත් ආරක්ෂක පියවරයන් අනුගමනය කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**ප්‍රධාන බස් නැවතුම්පොළවල සම්බන්ධීකාරක / හිමිකරු / රියදුරු / කොන්දොස්තර**

- සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අවසර දී ඇති උපරිම මගීන් සංඛ්‍යාවට පමණක් ගෙන යාමට වග බලා ගත යුතුය. තත්වය වෙනස් වීමත් සමඟ උපරිම මගීන් සංඛ්‍යාව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දැනුම් දෙනු ලැබේ.
- මගීන් කිසිවෙකු බස් රථය තුළ සිටගෙන ගමන් නොකළ යුතුය.
- ආසන පේළි 2 හෝ 3 පේළිවල මගීන් දෙදෙනෙකු යාබද ආසනවල අසුන් නොගන්න බවට සහතික විය යුතුය.
- බස්රථ තුළ සියලුම කවුළු විවෘතව තැබිය යුතු අතර සුඛෝපභෝගී බස් රථවල වායු සමීකරණ ක්‍රියා විරහිත කර ධාවනය කළ යුතුය.
- සියළුම මගීන් මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.
- අත් සේදීමේ පහසුකම් ප්‍රධාන බස් නැවතුම්පොළවල ඇති බවට සහතික වන්න.
- ඇල්කොහොල් අඩංගු පිරිසිදුකාරක බෝතල් රියදුරන්ට සහ කොන්දොස්තරවරුන්ට ලබා දෙන්න.
- හැකි නම්, බස් රථයේ දොරටුවේ ආසන්නයේ ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කරක බෝතලයක් සවිකරන්න.
- සෑම රාත්‍රියකම බස් රථ පිරිසිදු කර ඇති බවට සහතික වන්න. සාමාන්‍ය පිරිසිදුකාරක/සබන් භාවිතා කලහැක.
- බස්රථය තුළට ඇතුළුවන/ගමන්කරන අතරතුර අත් වාරු ස්පර්ශ නොකර සිටීම සඳහා බස්රථයට නැගීමට සහ එයින් බැසීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- බස්රථය තුළ ඒක දිශානුගත ප්‍රවාහයක් අනුගමනය කරන්න - ඇතුල්වීම සහ පිටවීම සඳහා නියම කල දොරවල්.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම අයිතිකරු/ රියදුරු වගකීම වේ.

**මගීන්**

- එකිනෙකාගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගනිමින් බස් නැවතුම්පොළේ පෝලිමේ සිටීමට වගබලාගන්න.
- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතුය.
- පහසුකම් තිබේ නම්, සබන් හා වතුරෙන් අත් සේදීම හෝ බස් රථයට ඇතුළු වීමට පෙර ඇල්කොහොල් අඩංගු අත සේදුම්කරක භාවිතයෙන් විෂබීජහරණය කරන්න.
- යාබද ආසනවල හිඳ නොගෙන බස් රථය තුළ මීටර් 1 ක දුරක් පවත්වා ගෙන යන බවට සහතික වන්න.
- ඔබගේ ආරක්ෂාව සඳහා අවසර ලත් ධාරිතාව ප්‍රමාණය ඉක්මවා ඇති බස් රථයට ඇතුළු නොවන්න වගබලාගන්න.
- ගෙන යන ගමන් මළු ප්‍රමාණය සහ භාණ්ඩ අවම කරන්න.
- හැකි තරම් බස් රථය තුලදී ජංගම දුරකථනය භාවිතා නොකිරීමට වගබලාගන්න.
- නියමිත මුදල ගෙවීමෙන් මුදල් හැසිරවීම අවම කිරීමට උත්සාහ කරන්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ඨ අනවශ්‍ය ලෙස ස්පර්ශ නොකරන්න, උදා. ආසන, දොරවල්, බාර් ආදිය.
- බස් රථයේ ගමන් කිරීමෙන් පසු අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා වතුරෙන් අත් සෝදන්න.
- ඔබට සුළු හෝ ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් බස් රථ භාවිතා කිරීමෙන් වළකින්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ජනමාධ්‍ය.
- ප්‍රධාන බස් නැවතුම්පොළවල පොදු ලිපින පද්ධති හරහා නිවේදනය කරන්න.
- සියලුම බස් රථවල අදාළ උපදෙස් දොරටුවේ ප්‍රදර්ශනය කෙරේ.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.